## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2018

----------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ සහ 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 46 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි 15 ඡේදය ප්‍රකාරව තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට මැනිය යුතු වුවද,එකතුව රු.22,902ක්වූ භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින තොගයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් හි පිරිවැයට ගිණුම්ගත කර තිබුණි. | 2019 වර්ෂය තුළ මෙම රු.22,902 වටිනාකමැති තොග ශේෂය සම්බන්ධයෙන් කමිටුවක් පත්කර කමිටු නිර්දේශය පරිදි එය ඉවත්කර පොතත්වල අදාළ ගැලපීම් සිදුකර ඇත. | ගිණුම් සැකසීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) සමාලෝචිත වර්ෂය සඳහා අනෙකුත් ආදායම් යටතේ ප්‍රාග්ධන අරමුදල් හායනය ලෙස රු.52,656,585 ක් ගිණුම්ගතකර ඇතත්, ගණනය කිරීම් අනුව එය රු.52,714,458 ක් වීමෙන් රු.57,873 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. කෙසේ නමුදු ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ගිණුම් සැකසීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය |
| ආ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා දෙකකදී වත්කම් විකිණීමෙන් හා ඉවත් කිරීමෙන් ජනිත වූ එකතුව රු.300,723 ක අලාභය ආදායම් ප්‍රකාශනයට මාරු නොකර පොදු සංචිතයට මාරුකර තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ගිණුම් සැකසීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය |
| ඇ) සමාලෝචිත වර්ෂයේදී වත්කම් විකිණීමෙන් ලද රු.44,700ක මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා නොතිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ගිණුම් සැකසීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය |
| ඈ)මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ආයෝජන වෙනස්වීම ගණනය කිරීම් අනුව රු.22,660,092 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.22,610,092 ක් ලෙස දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු.50,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ගිණුම් සැකසීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ණය ගැතියන් අඩුවීම රු.466,352 ක් ලෙස දක්වා ඇතත්, ගණනය කිරීම් අනුව එය රු.7,513,150 ක් වීමෙන් මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු.7,046,798 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ගිණුම් සැකසීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය |
| ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ විවිධ ණයහිමියන්ගේ වෙනස්වීම | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට වගබලා ගන්නා ලෙස | ගිණුම් සැකසීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය |

| | | |
|---|---|---|
| රු.13,909,714 ක සෘණ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා ඇතත්, ගණනය කිරීම් අනුව එය රු.9,396,202 වීමෙන් මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු.4,513,512 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. | |
| (උ) සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.745,391 ක්වූ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ඌනතාවය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. මෙය ජර්නල් අංක 72 මගින් 2019 වසර තුළ නිවැරදි කර ඇත. | ගිණුම් සැකසීමේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | i. ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය අවසන්කර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද දින 10 සිට 25 දක්වා එම කාලසීමාව ඉක්මවා පියවීම් කර තිබුණි. | එකඟවෙමි. මෙය විශ්වවිද්‍යාලයේ පොල්කැඩීම සඳහා ලබාගන්නා ලද අත්තිකාරම් මුදලකි. කැඩීමට සුදුසු පැසුණු පොල් තිබෙද යන්න පූර්ව නිගමනය කළ නොහැකි බැවින් විශ්වවිද්‍යාලයේ සියලු පොල්ගස් ප්‍රමාණය මත අත්තිකාරම් ලබාගත්තද පියවූ ගස්වල පොල් නොකැඩීම මත වැඩිපුර මුදලක් ඉතිරිවී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | ii. අදාල කාර්යයට ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු නොකර රු.7,785 සිට රු.16,690 ක ප්‍රමාණයක වැඩිපුර අත්තිකාරම් ලබාගැනීම සහ වියදම් නොවී ඉතිරි වන මුදල අදාල දිනවලදීම ආපසු තැන්පත් කළයුතු වුවද, දින 13 සිට 35 අතර කාලයක ප්‍රමාද වූ අවස්ථා තිබුණි. | එකඟ වෙමි. 2018.04.10 දින මෙම විශ්වවිද්‍යාලය හා ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය ඒකාබද්ධව පැවති පළමු වැඩසටහනේ අනුමත මුදල් ඇස්තමේන්තුව ප්‍රකාරව මුදල් අත්තිකාරම් ලබාගෙන ඇත.<br>එහෙත් පසුව දේශන ගාස්තු චෙක්පත්වලින් ගෙවීමට පරිපාලනය ගෙනඇති තීරණය මත කටයුතු කළ බැවින්ද, සිංහල සහ හින්දු අළුත් අවුරුදු නිවාඩු බැවින් හා ශිෂ්‍ය ස්වාමින්වහන්සේලාගේ දේශන පැමිණීමේ ප්‍රතිශත ලේඛන ගනනය කිරීමේ කටයුතු සිදුවූ බැවින් අත්තිකාරම් මුදල් නැවත පියවීම දින 05කින් අතපසුවී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. | අත්තිකාරම් ලබාදීම විශේෂිත කාර්යයට ආසන්නතම දිනකදී සිදුකළ යුතු වුවද අදාළ කාර්යය කිරීමට දින 19 – 25 කට පෙර අත්තිකාරම් ලබා දී තිබුණි. | එකඟවෙමි. අත්තිකාරම් ලබාගත් අය දැනට විශ්වවිද්‍යාල සේවයේ නොමැති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවන ලෙස වගබලා ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.55,048,393ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.48,834,341ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,214,052ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් සහ වේතන සහ ක්ෂයවීම්වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වර්ෂයේ ප්‍රධාන ආදායම්, සමාලෝචිත වර්ෂය සමග සැසඳීමේදී පුනරුත්තාපන, හැකියා වර්ධනය හා පර්යේෂණ සහ සංවර්ධන සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සියයට 58කින් අඩුවී තිබුණු අතර විවිධ ආදායම් කාණ්ඩය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 57කින් අඩුවී තිබුණි.

එමෙන්ම ප්‍රධාන වියදම් බාණ්ඩ අතුරින් පුද්ගල පඩිනඩි හා විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වැයකළ මුදල් ප්‍රමාණය සියයට 31 කින් ද පුහුණු හා සංවර්ධන වියදම් සියයට 230කින් ද වර්ධනය වී තිබුණු අතර ගිවිසුම්ගත සේවා සඳහා වන වියදම් ද සියයට 11කින් වර්ධනය වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

පසුගිය වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය1:0.39 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 1:1.25ක් ලෙස වර්ධනය වී තිබුණි. එමෙන්ම ක්ෂණික වත්කම් අනුපාතය ද පෙර වර්ෂය හා සසඳන කළ1: 0.374 සිට1: 1.2 දක්වා වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශ සංචාරයකට සහභාගීවීම වෙනුවෙන් සංචාරයට පෙර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු නොකර යානාපත්‍ර, ලියාපදිංචි ගාස්තු, අනියම් සහ සංයුක්ත දීමනා ලෙස විශ්වවිද්‍යාලය විසින් වියදම් දරා තිබූ නමුදු සංචාරය අවලංගුවීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.138,209 ක පාඩුවක් සිදුව තිබුණි. | 2018.09.23 දින සිට 2018.09.26 දින දක්වා කැනඩාවේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය උපකුලපති වරුන් ගේ සමුළුව සඳහා මෙම විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යයන් වහන්සේ සහභාගීවීමට අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමට අදාලව 2018.08.16 දිනැතිව ලේඛන යොමුකරන ලදී. මෙම සමුළුවේ | නිසි අනුමැතීන් ලැබුණු පසු හා අදාළ සමුළු සංවිධාන ආයතන තිබෙන බවට තහවුරු කර ගැනීමෙන් |

| | | |
|---|---|---|
| | ලියාපදිංචි වීමේ අවසාන දිනය 2018.09.08 දින බැවින් අදාල අනුමැතිය අපේක්ෂාවෙන් ලියාපදිංචි කටයුතු යානාපත්‍ර වෙන්කිරීම හා නිවාඩු අනුමත කරවාගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. මේ වනවිට උක්ත සමුළුවට සහභාගිවීම අවලංගු කරතිබූ බැවින් අනියම් දීමනා හා සංයුක්ත දීමනා ආපසු ගෙවන ලද අතර විශ්වවිද්‍යාලය නිසිලෙස කටයුතු කිරීම නිසා පාඩුව අවම කරගැනීමට හැකිවිය. | අනතුරුව අවශ්‍ය යානාපත්‍ර සහා හා අනෙකුත් ගෙවීම් කළ යුතු වීම. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දානශාලාව සහ ශිෂ්‍ය කේන්ද්‍රිය මධ්‍යස්ථානය 2016 වර්ෂයේ රු.213,385,000කට ගිවිසුම්ගතව වැඩ ආරම්භ කර ඇතත්, 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතින් සංශෝධිත 1978 අංක 94 දරන පනතේ 8(ඒ) වගන්තිය ප්‍රකාරව අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද ලංසු ලියවිලිවල කොන්ත්‍රාත්කරුගේ අවශ්‍යතා (Employees Requirements) වලට අදාළවූ 1.5.3 (ඒ) හා 1.5.6 ඡේදවලට අනුකූලව අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අදාල අනුමැතිය ලබාගැනීමට කටයුතු කෙරෙමින් පවතී.අනුමත ඇස්තමේන්තුව තුල විදුලි සෝපානයත් සැපයීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොමැති අතර ආබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවය සඳහා විතැන් කළහැකි ආධාරකයක් අදාල ස්ථානවල ස්ථාන ගතකර ඇත. පැවති සීමිත ඉඩකඩ ප්‍රමාණය පදනම් කරගෙන පවතින භූමි ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජනයක් ගැනීමට හැකිවන පරිදි බිම පිරවීමක් සිදුකර මෙකී අවශ්‍යතාවයට හැකිවන පරිදි වාහන නැවතුම් ස්ථාන ස්ථාපිත කර ඇත. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර පූර්ව සැලසුම් විධිමත් වීම සහ චක්‍රලේඛ වලට අනුකූල විය යුතුය |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලයේ තනතුරු වන මහෝපාධ්‍යා තනතුර, පුස්තකාලයාධිකාරී තනතුර, මහාචාර්ය තනතුරු 04ක් හා ඉංග්‍රීසි හා බෞද්ධ උපදේශක තනතුරු 02ක්ද පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිපාලන තනතුරු 03ක්ද ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි තනතුරු 03ක්ද ඇතුළුව මුළු තනතුරු 21ක පුරප්පාඩු සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | නොපමාව පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 ජනවාරි 27 දිනැති අංක PED/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කළයුතු වුවද ගිණුම් ඉදිරිපත් කරන ලද්දේ 2019 අප්‍රේල් 30 දිනදීය | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව විගණනයට ගිණුම් ඉදිරිපත් කළයුතුය |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් විගණන විමසුම් 23 ක් නිකුත්කර තිබූ නමුත් විගණන දිනය වන විට විගණන විමසුම් 16කට පිළිතුරු ලැබී නොතිබුණු අතර එම කාලසීමාව මාස 07 සිට මාස 15 දක්වා කාල පරාසයක් වූ හෙයින් විශ්වවිද්‍යාලයේ ඵලදායිතාවයට අභ්‍යන්තර විගණන ඒකකය දායක කරගෙන නොතිබුණු බව තහවුරු වුණි. තවද, අභ්‍යන්තර විගණන ඒකකය විසින් නිකුත්කරනු ලබන විමසුම්වල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මේ වන විට පිළිතුරු සපයා ඇති අතර අදාල විමසුම් සඳහා නිවැරදි කිරීම් සිදුකර ඇත. | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවතුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල තම ක්‍රියාකාරී සැලැස්මෙහි ඊට අදාල ක්‍රියාකාරකම් ඇතුළත්කර තිබූ බවට හා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසාගෙන තිබූ බවට හඳුනාගත නොහැකි විය. | මෙම විශ්වවිද්‍යාලයේ අරමුණ සලකා බැලීමේදී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලබගැනීම පිණිස ඍජු ලෙසම දායක නොවේ. කෙසේ නමුත් ඉදිරියේදී 2017.08.14 දිනැති අංක එන්.පී/එස්.සී.පී.17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත්කරන ලද චක්‍රලේඛයට අනුව අනුගත වෙමින් කටයුතු කිරීමට සටහන් කරගෙන ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |